





8 වන පිටෙන්

මලයනාඩු වැනි දෙයක් හෝ, සිංහල ශ්‍රී ලංකාව කඩා නිර්මාණය කර ගන්නා නසිරිස්තාන් වැනි දෙමළ-මුස්ලිම් පාරාදීසයක් විය යුතුය. මේ සමින්ත්‍රණයේ තේමා පාඨය ඕනෑ කමින්ම තෝරා ගන්ට ඇත්තේ, එවැනි ගිනි අවුලුවන අදහසක් ජනනය කිරීමට විය යුතුය. 1987-89 වකවානුව මාදිලියේ භීතිකා සංදර්ශනයක් වූ මේ සම්මන්ත්‍රණයට දිනේෂ් ගුණවර්ධන සහ, සියල්ලන්ටමත් වඩා බැසිල් රාජපක්ෂ වැනි "ඒකාබද්ධ විපක්ෂයේ" ලොකු ලොක්කෝ සහභාගී වූහ. වේදිකාවේ සිටි වඳුරන්ගේ රංගනය, වේදිකාව පසුපස සිට ඕගන් වාදකයන් නරඹනු අන්තර්ජාලය හරහා දැක ගත හැකි විය.

මහින්ද රාජපක්ෂ යනු, මුල්ම පළාත් සභාව බෙදුම්වාදය සඳහා තැනුනු පාලමක් යැයි ගෙනහැර පාමින් මීට තිස් වසකට කලින් ඊට මාරක විරෝධය පෑ කෙනෙකි. පළාත් සභා වෙනුවෙන් පෙනී සිටි සහ ඒවාට සහභාගී වූ මිනිසුන්ව එදා අමු අමුවේ මරා දැමුණි. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට විරෝධය පෑමේ මුවාවෙන් රටම ගිනි තැබුණි. පළාත් සමග බලය බෙදාහදා ගැනීම, ෆෙඩරල් වාදයක් වශයෙන් අර්ථ ගැන්වුණු අතර එය බෙදුම්වාදයට සමාන කෙරුණි.

13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ පළාත් සභා, බෙදුම්වාදයකට නෑකමක් නොදක්වන බව අද මහින්ද රාජපක්ෂ මහතා පිළිගනු ඇත. පළාත් සභා මැතිවරණ කල් දැමීමට වත්මන් ආණ්ඩුව ගත් බියගුළු උත්සාහය ඔහු ඉතා නිවැරදිව විවේචනය කළ නිසා, කොහොමත් ඔහුට එය පිළිගැනීමට සිදුවෙයි. පමාවකින් තොරව පළමු පළාත් සභා තුනේ ඡන්දය පැවැත්විය යුතු යැයි ඉතා නිවැරදිව අද ඔහු ඉල්ලා සිටින නිසා කොහොමත් ඔහුට එය පිළිගැනීමට සිදු වෙයි. මේ සම්බන්ධයෙන් තම ස්ථාවරය වෙනස් වී තිබීම ගැන ඔහු රටට පැහැදිලි කිරීමක් කළ යුතුව තිබේ. වැඩියත්ම, සිරිසේන*වික්‍රමසිංහ ආණ්ඩුවේ ව්‍යවස්ථා කෙටුම්පත් ක්‍රියාවලියට එරෙහිව ඔහු සහ ඔහුගේ හෙංචයියන් අද මතු කරන විවේචන, මීට තිස් වසකට පෙර ලේ වැකි කාල පරිච්ඡේදයක, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට සහ පළාත් සභා ක්‍රමයට එරෙහිව ඔවුන් නැගූ විවේචනයන්ට බෙහෙවින් සමාන වන නිසා, ඔහු ඒ පැහැදිලි කිරීම කළ යුතුව තිබේ.

## සන්නස Cartoon by PK



## යක්ෂයාව ශක්තිමත් කරන්නේ කවුද?

මෑතකදී යාපනයේ කළ සංචාරයේදී එතරම් ආදරය නොවු පිළිගැනීමක් ලද ජනාධිපති සිරිසේන, තමාව දුර්වල නොකරන්නැ යි දෙමළ ජනතාවගෙන් ඉල්ලා සිටියේය. ඔහු කී පරිදි, ඔහුව දුර්වල කිරීම යනුයක්ෂයාව බලගැන්වීමකි. යක්ෂයා යනුවෙන් ජනාධිපතිවරයා අදහස් කෙළේ, පසුගිය ජනාධිපතිවරණයේදී, දන්න යක්ෂයාට ඡන්දය පාවිච්චි කරන්නැයි දෙමළ ජනතාවගෙන් ඉල්ලා සිටි මහින්ද රාජපක්ෂ බව පැහැදිලි ය. පවතින දේශපාලන යථාර්ථය තුළ ජනාධිපති සිරිසේනගේ අනතුරු ඇඟවීම සදොස් නැත. මන්ද යත්, සිරිසේන*වික්‍රමසිංහ පාලනය සඳහා පවතින එකම විකල්පය, යළිත් වරක් රාජපක්ෂලා ජයග්‍රාහීව බලයට පැමිටම වන බැවිනි.

එහෙත් ඒ ගැන ඡන්දදායකයාට දොස් කීමේදී ජනාධිපතිවරයා කරන්නේ වැරැද්දකි. දෙවරක් පරාජයට පත් කළ රාජපක්ෂලාට යළි ජීවය ලබා දී ඇත්තේ, ජනාධිපතිවරයා, ඔහුගේ අගමැතිවරයා සහ ආණ්ඩුව මිස ඡන්දදායක ජනතාව නොවේ. ශලීල මුණසිංහ සහ ඔහුගේ අනුග්‍රාහක රවි කරුණානායක පිළිබඳ සිදුවීම්, ගුරුවරියක් ඇගේ පංතියේදීම දණ ගැස්සූ ප්‍රාදේශීය දේශපාලඥයෙකුට ආසන සංවිධායක ධුරයක් දීම වැනි අශ්ලීල සිදුවීම්, ඊට දෙස් දෙන මෑත කාලීන සිදුවීම් ය.

තමන්ට බලයට ඒම සඳහා රටම ගිනි තැබීමට රාජපක්ෂලා කැමති වේවි. එහෙත් ඒ සඳහා ඔවුන්ට පන්දම් සපයන්නේ සිරිසේන*වික්‍රමසිංහ ආණ්ඩුවයි. බලයට පත්වීමෙන් පළමු දෙවසර තුළ අලූත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට ආණ්ඩුව උත්සුක නොවුණා පමණක් නොව, අලූත් ව්‍යවස්ථාවක් සඳහා අවශ්‍ය කරන ජාතික සන්ධානයක් ගොඩනැගීමට ආණ්ඩුව පියවර නොගත්තා පමණක් නොව, අනපේක්ෂිත සාධනීය වර්ධනයන් සහ අවස්ථාවන් තමන්ගේ වාසියට හරවා ගැනීමටත් ආණ්ඩුව අපොහොසත් විය. උදාහරණයක් වශයෙන්, ෆෙඩරල්වාදය යනු බෙදුම්වාදය නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව ගැන ආණ්ඩුවට මෙලෝ වගක් නොවුණි. දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳන අලූත් ආණ්ඩු ක්‍රමයක අවශ්‍යතාව අවධාරණය කළ මල්වතු පාර්ශ්වයේ මහ නායක හිමියන්ගේ ප්‍රකාශය ආණ්ඩුවට ගානක් නොවුණි.

රාජපක්ෂවාදි ඒකාබද්ධ විපක්ෂය බලගැන්වෙන්නේ ආණ්ඩුවේ අසාර්ථකත්වය ඔස්සේ ය. බලතල බෙදාහදා ගැනීම යනු මහා නපුරක් සේ ඒකාබද්ධ විපක්ෂයේ අන්ත ජාතිවාදීන් අර්ථ ගන්වන්නේත්, එවැනි බලතල බෙදාහදා ගැනීමේ ක්‍රමයකට විරුද්ධ වීම දේශප්‍රේමයක් වශයෙන් අර්ථ ගන්වන්නේත්, ආණ්ඩුවේ අසාර්ථකත්වය නිසා ය. 1980 අවසන් භාගයේදී මිතුරා සතුරාගෙන් වෙන් කොට හඳුනා ගැනීමේ තිරශ්චීන රේඛාව, ඉන්දු*ලංකා ගිවිසුම, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ පළාත් සභා හරහා ඇඳුණේ යම් සේ ද, අද දේශප්‍රේමියාගෙන් දේශද්‍රෝහියා වෙන් කොට හඳුනා ගැනීමේ රේඛාව යෝජිත ව්‍යවස්ථාව හරහා ඇඳ ගැනීමට ඔවුහු වලිකති. තාර්කික තර්ක විතර්ක වෙනුවට, ආක්‍රෝෂ පරිභවයම ඉස්මත්තට ගෙනෙති.

පරණ පිස්සුව යළි ප්‍රාදුර්භූත වීම වැළැක්වීමට තවමත් ආණ්ඩුවට පුළුවන. අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය කරන්නේ ඇයි ද යන්නත්, ඒ කුමක් සඳහා ද සහ එය සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්නත් ජනතාවට පහදා දිය යුතුව තිබේ. දකුණේ උමතුව වැපිරීමෙන් ප්‍රයෝජන ගැනීමට බලන රාජපක්ෂවාදී ඒකාබද්ධ විපක්ෂයේ නරුම ප්‍රයත්නයන් හෙළිදරව් කළ යුතුව තිබේ. රාජපක්ෂගේ ආක්‍රොෂවලට තර්කානුකූල හේතු දැක්වීම්වලින් පිළිතුරු දිය යුතුව තිබේ. ඒ කාරණය සම්බන්ධයෙන් ආණ්ඩුව අසමත් වෙතොත්, "මව්බිමේ ගැලවුම්කාරයා" වශයෙන් අනිවාර්යයෙන්ම යක්ෂයා යළි ප්‍රාදුර්භූත වනු ඇත. ඒ ව්‍යසනය සිදු වෙතොත්, ආණ්ඩුවම මිස වෙන කිසිවෙකු ඊට වැරදිකරු නොවේ.

*2017 ඔක්තෝබර් 22 වැනි දා කළම්බෝ ටෙලිග්‍රාෆ් වෙබ් අඩවියේ පළවූ* Remember@ Remember` *නමැති ලිපියේ සිංහල පරිවර්තනය*

*යහපාලනය ලංකා*